# ශ්‍රී ලංකාවේ යුරෝපීය යටත් විජිත සමයේ භාවිත ගෘහ භාණ්ඩ

ජේ. පී. සි. ජයවීර

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය piyojayaweera@gmail.com

ප්‍රමුඛ පද - යුරෝපීයන්, ලී, කැටයම්, ගෘහ භාණ්ඩ, තාක්ෂණය

## හැඳින්වීම

ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණයන්හි ඉතිහාසය මිනිස් ඉතිහාසය තරම් ඈතට දිව යන්නක් වේ. එය වසර දහස් ගණනක් පුරා අලංකරණය සහ සැලැස්ම වෙනස් වෙමින් පැමිණ ඇත. ප්‍රංශ භාෂාවේ fourniture යන වචනයෙන් ඉංග්‍රීසි භාෂාවේ furniture (ෆර්නිචර්) යන වචනය සකස් වී ඇත. ගෘහ භාණ්ඩ යන සමූහවාචී පදය පැරණි සිංහල සාහිත්‍යයේ දක්නට නොලැබෙන අතර පසු කාලයක භාවිතයට පැමිණ ඇත. (අරුණසිංහ, 2001:296) ගෘහ භාණ්ඩ කලාව මෙන් ඒ හා බද්ධව පවතින අනෙක් කලාව නම් ගෘහ උපකරණ වේ. ගෘහ සහ ජීවනෝපාය කාර්යයන් සඳහා උපකාරී වූ මෙවලම් (ආම්පන්න) ගෘහ උපකරණ නම් වේ. (ජයකොඩි, 2001:223) පෙර අපර දෙදිග සෑම රටකම පාහේ ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ නිෂ්පාදනය අතීතයේ සිටම පැවතී තිබේ. ශ්‍රී ලංකාවේ ද දේශීය සංස්කෘතික අනන්‍යතා ලක්ෂණ ගැබ් වී ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ කලාවක් පැවතී ඇත. එකල ගෘහ භාණ්ඩ ඔවුන්ගේ සමාජ තත්ත්වය නිර්ණය කරනු ලබන සාධකයක් විය. ගෘහ භාණ්ඩ අතිශය චාම් විය. කකුල් තුනේ බංකු හෝ කොලොම්බු මිනිසුන්ගේ තත්ත්වය අනුව ආසන වශයෙන් දෙනු ලැබේ. ඇන්දක් සහිත අසුනක වාඩිවිය හැක්කේ රජුට පමණි. (ජයකොඩි, 2001:223)

මෙලෙස පැවති දේශීය ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ කලාව යුරෝපීයන් මෙරට යටත්කර ගැනීමත් සමඟ විවිධ වෙනස්කම්වලට භාජනය විය. මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් යුරෝපීය යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවේ භාවිත ගෘහ භාණ්ඩ මොනවාද යන්න සහ එම ගෘහ භාණ්ඩයන්හි සුවිශේෂ ලක්ෂණ කවරේ ද යන්න අධ්‍යයනයට භාජනය වේ. ගෘහ භාණ්ඩ සඳහා භාවිත අමුද්‍රව්‍ය, තාක්ෂණය, උපයෝගීතාවය සහ එම ගෘහ භාණ්ඩවල සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීමට උත්සහ ගෙන ඇත.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රයන් යොදාගත් අතර ක්ෂේත්‍ර අධ්‍යයන යටතේ කෞතුකාගාර අධ්‍යයනයන් සිදුකරන ලදි. කොළඹ කෞතුකාගාර, කොටුව ඕලන්ද කෞතුකාගාරය අධ්‍යයනයට ලක්විය. වර්තමානයේ ඉතා අඩු ගෘහ භාණ්ඩ ප්‍රමාණයක් පැවතීම අධ්‍යයනය සීමා වන්නට හේතු විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

යුරෝපීය ගෘහ භාණ්ඩ කලාව මෙරටට ප්‍රථමයෙන් හඳුන්වාදෙනු ලැබුයේ පෘතුගීසීන් විසිනි. පෘතුගීසී සමයේ භාවිත ගෘහ භාණ්ඩ වර්තමානය වනවිට දක්නට ලැබෙන්නේ ඉතා සීමිත ප්‍රමාණයකි. ඒ අතර බංකු, ඇඳි පුටු, ඇඳන් ආදිය වේ. වර්තමානයේ කෞතුකාගාරවල බහුලව ම පවතිනුයේ ලන්දේසි සමයට අයත් ගෘහ භාණ්ඩ වේ. ලන්දේසි පාලන යුගය ඕලන්දයේ ගෘහ භාණ්ඩ පිළිබඳ

ස්වර්ණමය යුගය විය. යුරෝපයේ විශිෂ්ට ගෘහ භාණ්ඩ ශ්‍රී ලංකාවට ලැබීමට මෙය හේතු විය. පුටු වර්ග ( අත් ඇදි සහිත, අත් ඇදි රහිත, කවිච්චි, රවුම් පුටු, හාන්සි පුටු ), මේස, අල්මාරි, පෙට්ටගම්, ඇඳන්, ඉටි පන්දම් ආධාරක, බිත්ති රාක්ක මේ අතර වේ. බ්‍රිතාන්‍යය පාලන යුගය වනවිට මධ්‍යයම පාන්තිකයන්ගේ ආර්ථික තත්ත්වය වැඩිවීම නිසා තත්ත්වයෙන් උසස් ගෘහ භාණ්ඩ ශ්‍රී ලංකාවට ලැබුණි.

මෙම ගෘහ භාණ්ඩ සඳහා භාවිත අමුද්‍රව්‍ය මොනවාද යන්න අවධානය යොමු කිරීමේදී පෘතුගීසි සමයේ ඒ සඳහා බහුලව රත් හඳුන්, කළුවර, නැඳුන්, වේවැල් වැනි ශාක දැව වර්ග ද ලන්දේසි සමයේ දී තේක්ක, කොස්, බුරුත, කළුවර, වේවැල් වැනි ශාක දැව වර්ග ද භාවිතා කර ඇත. බ්‍රිතාන්‍යය යුගයේ දී තේක්ක, කළුවර, කළු මැදිරිය, රෝස දැව, කොස්, බුරුත, නැඳුන්, වේවැල් වැනි ශාක දැව වර්ග භාවිතා කරතිබේ.

ගෘහ භාණ්ඩ විවිධ උපයෝගීතාවයන් සඳහා භාවිතාකර තිබෙන අයුරු නිරීක්ෂණය විය . හිඳ ගැනීමට, ඇඳුම් හා විවිධ ද්‍රව්‍ය අසුරා තැබීමට, නිදා ගැනීමට, මිල මුදල් හා වටිනා භාණ්ඩ ආරක්ෂාකර ගැනීමට මේවා උපයෝගී කරගෙන තිබේ. මෙකී ගෘහ භාණ්ඩයන්හි තාක්ෂණය කෙබඳු ද යන්න විමසා බැලීමේ දී පුටු වර්ග, ඇඳන් ආදිය මානව මිතිය අනුව නිර්මාණයකර තිබෙන අයුරු හඳුනාගැනීමට පුළුවන. ඒ අනුව ඇඳක දිග, උස, පළල ද තීරණය කර නිර්මාණයට යොමුවී. ඇතිබව පෙනේ. පුටු වර්ග ද මිනිසාගේ බර, උස, තුනටිය සහ සුව පහසුව කෙරෙහි සැලකිලිමත්ව නිර්මාණයකර ඇත. සාමාන්‍යය පුටුවක උස සෙ.මී 95 , පළල සෙ. මී 53 අගයක් ගනු ලැබේ. සාමාන්‍යය ඇඳක දිග සෙ.මී 200 , පළල සෙ.මී 203 , උස සෙ.මී 128 අගයකින් යුක්තය.

සෑම ගෘහ භාණ්ඩයක් ම අලංකාර කැටයමින් යුක්ත වේ. පුටු ඇදි හා විට්ටම්, ඇඳ විට්ටම්, ඇඳ හා පුටු කකුල්, මේස මතුපිට හා කකුල් ආදියේ කැටයම් බහුල වේ. මීට අමතරව රාක්ක, පෙට්ටගම්, අල්මාරිවල ද කැටයම් දැකගත හැකිය. මල්කම්, ලියකම්, ලාංඡන, සත්ව රූප කැටයම් අතර වේ. ඇඳන් නිර්මාණයේ දී වියන් ලක්ෂණය බහුලවේ. පුටු, ඇඳන්, පෙට්ටගම්, රාක්ක, අල්මාරි ආදියේ කකුල් විවිධ ප්‍රමාණයෙන් සහ විවිධ හැඩයෙන් යුක්ත වේ. මෙලෙස නිර්මාණය සිදුකර ඇත්තේ බර දරා ගැනීමට හැකිවන පරිදි ය. කොටස් එකිනෙක සම්බන්ධ කිරීමට ලී ඇණ බහුලව භාවිතාකර ඇත. පුටුවෙහි හිඳ ගැනීමට සහ පිට තබා ගන්නා කොටස් වේවැලින්, සම්පූර්ණ ලීයෙන්, හා කුෂන්කර තිබේ. පෙට්ටගම්, අල්මාරි, බිත්ති රාක්ක ආදියෙහි තබන භාණ්ඩ ආරක්ෂා කිරීම සඳහා අලංකාර, විවිධ කැටයම් සහිත යතුරු තහඩු දක්නට ලැබේ. මේවා කොටස් තුනකින් යුක්තය. යතුරු තහඩුව, අල්ලුව, මොට්ටුතර ඇණ එම කොටස් වේ. මෙම කොටස් තඹ, පිත්තල, යකඩවලින් නිමකර ඇත. මේවායේ ඇති කැටයම් අතර මල්කම්, ලියකම් දැකගැනීමට පුළුවන. මෙම භාණ්ඩයන්හි දොර පියන් ඇරීමට වැසීමට හැකිවන පරිදි විවිධ සරනේරු වර්ග භාවිතාකර ඇත. මේවායෙහි ද කැටයම් දැකගත හැකි වේ. මෙම ගෘහ භාණ්ඩ දේශීය ගෘහ භාණ්ඩයන්ගෙන් වෙනස්වන කරුණු අතර විශාල ගෝලාකාර හැඩ ගන්නා කකුල්, යතුරු තහඩු සහ අනෙකුත් කැටයම් ප්‍රධාන තැනක් ගනු ලබයි.

### ආශ්‍රිත ග්‍රන්ථ

කුමාරස්වාමි, ආනන්ද කේ. (1962) සෝමරත්න, ඇම්. එච්. (පරි.). **මධ්‍ය කාලීන සිංහල කලා**, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

ජයකොඩි, ජේ. ඒ. එල්. පි., අරුණසිංහ, කේ. (2001), ***සිංහල විශ්ව කෝෂය***, 10 වන කාණ්ඩය: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

Brohier, R. L.(1969) ***Furniture of the dutch period in Ceylon***, Colombo National museums.